සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 8– Third Term Test – 2023(2024 February)

8 ශ්‍රේණිය - වාර පරීක්ෂණය - 2023

කාලය : පැය 2
Time: 2 hours

විද්‍යාව

Name: - .... class: -.................. Index no: - ....

A B

1 පත්‍රය

- පහත 1-20 දක්වා ඇති බහුවරණ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. විද්‍යුත් ධාරාව මනින අන්තර්ජාතික ඒකකය වන්නේ කුමක්ද?

(1)මිලි ඇම්පියර් (2)ඇම්පියර් (3)ඕම (4)වෝල්ට

2. මුල් වරට ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කරන ලද්දේ පහත කිනම් විද්‍යාඥයා විසින්ද ?

(1)බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් (2) මයිකල් පැරඩේ

(3) ඇන්ටන් වැන් ලිවන් හුක් (4) ජෝන් ඩෝල්ටන්

3. බෝවන රෝගය හා එම රෝගය සඳහා හේතුකාරක වන ක්ෂුද්‍රජීවී විශේෂය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සෙම්ප්‍රතිශ්‍යාව - බැක්ටීරියා (2)ලාදුරු - වෛරස්

(3)අළුහම් - දිලීර (4)ලේෂ්මාතියාව - දිලීර

4. මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රිය වන්නේ කුමක්ද?,

(1) ආමාශය (2) වෘක්ක (3)හෘදය (4)සම

5. සාවද්‍ය තොරතුර ඇතුලත් වගන්තිය වන්නේ කුමක්ද?

(1)කැරපොත්තා ආත්‍රෝපෝඩාවෙකි (2) කිඹුලා රෙප්ටිලියාවෙකි

(3)ගැඩවිලා නිඩාරියාවෙකි (4) සලමන්දරා ඇනලිඩාවෙකි

6. වායුධර මූල් දැකිය හැකි ශාකය කුමක්ද?

(1)නුග (2)බුලත් (3) ඔකිඩ (4) කිරල

7 රූපයේ දැක්වෙන පරිපථයේ P බල්බය පමණක් දැල්වීම සඳහා සංවෘත කළ යුතු ස්විච්ච වන්නේ,



1) S_1 හා S_3 පමණි 2) S_1 පමණි 3) S_3 පමණි 4) S_2 හා S_3 පමණි

EXAMRESULTS.LK

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

8) උස කඳු මුදුනකදී

1. ජලයේ තාපාංකය 100°C අඩු අගයකි   2. ජලයේ තාපාංකය 100°C වැඩි අගයකි

3. ජලයේ තාපාංකය 100°C කි   4. ජලයේ තාපාංකය පිළිබඳව කිසිවක් ප්‍රකාශ කළ නොහැක

9) කම්පන සංඛ්‍යාතය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න



1. B සරසුලට අඩුම සංඛ්‍යාතය ඇත

2. B සරසුලට වැඩිම සංඛ්‍යාතය ඇත.

3. A සරසුලට අඩු සංඛ්‍යාතයක් ඇත

4. සෑම සරසුලක කම්පන සංඛ්‍යාතය එකම අගයකි

10) චුම්භක ක්ෂේත්‍රයක දිශාව ලෙස සලකන්නේ කුමක්ද?

1. උත්තර ධ්‍රැවයේ සිට උත්තර ධ්‍රැවයටත් දක්ෂිණ ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවයටත් වේ

2. නිශ්චිත දිශාවක් නැත

3. දක්ෂිණ ධ්‍රැවයේ සිට උත්තර ධ්‍රැවය දක්වා ය

4. උත්තර ධ්‍රැවය සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා ය

11) අර්ධ දහනය යනු

1. ප්‍රමාණවත් තරම් ඔක්සිජන් වායුව නොලැබෙන විට සිදුවන දහනය

2. ප්‍රමාණවත් තරම් ඔක්සිජන් වායුව ලැබෙන විට සිදුවන දහනයයි

3. ප්‍රමාණවත් තරම් කාබන් ඩයොක්සයිඩ් වායුව ලැබෙන විට සිදුවන දහනයයි

4. නිපදවෙන තාප ප්‍රමාණය වැඩිනම් එය අර්ධ දහනයකි

12) නිරෝගී පුද්ගලයකුගේ මුත්‍රවල අඩංගු නොවන ද්‍රව්‍යයකි

1.ජලය   2. රුධිර සෛල   3.ලවණ   4. යූරික් අම්ලය

13) ඉහත දක්වා ඇති රූප A හා B සටහන් පිළිවෙලින්

පාදමට යවීන් ඇති සම්බන්ධක කම්බි



1. A වකන යතුර B ධාරා නියාමකයයි   2. A වකන යතුර හා B පේනු යතුරයි

3. ධාරා නියාමකය හා පේනු යතුරයි   4. පේනු යතුර හා ධාරා නියාමකයයි

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

14. ආහන්‍යතාව යන්නෙන් අදහස් වන්නේ,

(1) නොකැඩෙන සේ කම්බියක් මෙන් ඇදීමට ඇති හැකියාවයි

(2) කුඩු වීමට ලක් නොවී තහඩුවක් මෙන් තැලිය හැකි වීමයි

(3) බලයක් යෙදූ විට කුඩු වී යාමයි

(4) අතින් ඇල්ලූ විට දැනෙන රළු හෝ සිනිඳු බවයි

15. ප්‍රථම වානිජ සන්නිවේදන චන්ද්‍රිකාව ලෙස ගනු ලබන්නේ , A B

1. ටෙල්ස්ටාර් - I ය 2. එක්ස්ප්ලෝරර්- I 3.ස්පුට්නික් - I 4. ස්පුට්නික් - 2

16. මල බැඳීම සඳහා අවශ්‍ය සාධක පිළිබඳව සිදුකරන ලද පරීක්ෂණයක ඇටවුම් පහත දක්වා ඇත.දින කිහිපයකට පසු මල බැඳීමක් දක්නට නොලැබෙන්නේ කුමන ඇටවුමේ ඇති යකඩ ඇණයේද?



1.A 2.B 3.C 4.D

17. අකුණු පහරකදී ආරෝපණ පැනීම පිළිබඳව වැරදි ප්‍රකාශය කුමක්ද?

1. වළාකුලකින් ඇරඹී පෘථිවියෙන් අවසන් වන අකුණු ඇත
2. එකම වළාකුළ තුල ආරෝපණ පැනීමක් සිදු නොවේ
3. වළාකුළු දෙකක් අතර ආරෝපණ පැනීමක් සිදුවිය හැක
4. වළාකුලකින් වායුගෝලයට ආරෝපණ පැනිය හැකිය

18. දකුණු කුරුසය තරු රටාවට වම්පසින් දිප්තිමත් තරු 2ක් එක ලග පිහිටා ඇති අතර දකුණු කුරුසයට වඩා ඈතින් පිහිටන තරුව වන්නේ,

1. පෝලාරිස් 2. සිරියස් 3.ඇල්ෆසෙන්ටෝරි 4.ඇල්ඩෙබරන්

19. ජල සංරක්ෂණය සඳහා ශාක විවිධ අනුවර්තන දක්වයි.ගිළුණු පුටිකා දැකිය හැකි ශාකයක් කුමක්ද?

1. කෝමාරිකා 2. කනේරු 3. කස 4. අරලිය

20. පහත දැක්වෙන ද්‍රව්‍ය අතුරින් බහිස්‍රාවී ද්‍රව්‍යක් නොවන්නේ කුමක්ද?

1. මල ද්‍රව්‍ය 2.මුත්‍රා 3. කාබන්ඩයොක්සයිඩ් 4. යූරියා අම්ලය

(ල. 20)

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 8 – Third Term Test – 2023 (2024 February)

8 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2023 (2024 පෙබරවාරි)

කාලය : පැය 2
Time: 2 hours

විද්‍යාව

Name: - .... *class: -.................* *Index no: - ....*

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහතට පිළිතුරු සපයන්න

01. (A). අවස්ථා විපර්යාස සිදුවන විට සංයුතිය වෙනස් වී නව ද්‍රව්‍යක් නොසෑදේ



(i). a, b, c, d සහ e යන විපර්යාස හඳුන්වන නම් වෙන වෙනම ලියන්න (ල.05)

(ii) නව සංයුතියකින් යුත් නව ද්‍රව්‍ය සෑදෙන විපර්යාස හඳුන්වන නම කුමක්ද? (ල.01)

(iii). මැග්නීසියම් පටියක් වාතයේ දහනය කලවිට ලැබෙන ඵලය කුමක්ද? එහි වර්ණය කුමක්ද? (ල.01)

(iv) දහනයට උදව්කරන වායුව හඳුන්වන්නේ කවර නමකින්ද? (ල.01)

(B) (i). පත්‍ර වින්‍යාසය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.01)

(ii) පහත රූපයේ දැක්වෙන්නේ පත්‍ර වින්‍යාස කිහිපයකි. ඒ ඇසුරින් පහත a සහ b ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



1 2 3 4

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

(a) පේර ශාකයේ දැකිය හැකි පත්‍ර වින්‍යාසයේ අංකය ලියන්න. (ල.01)

(b). රුක් අත්තන ශාකයේ දැකිය හැකි පත්‍ර වින්‍යාසයේ අංකය ලියන්න. (ල.01)

(C)පහත දැක්වෙන පරිපථය හොඳින් අධ්‍යනය කොට පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න



(i). ඉහත A හා B ලක්ෂ අතරට තඹ කම්බි කැබැල්ලක්, යකඩ කම්බි කැබැල්ලක්, නික්‍රෝම් කම්බි කැබැල්ලක් විටින් විට තබමින් බල්බයේ දීප්තිය පරීක්ෂා කළහොත් වැඩිම දීප්තියක් ලැබෙන්නේ කිනම් කැබැල්ල භාවිතා කලවිටද? (ල.01)

(ii) අඩුම දීප්තිය ලැබෙන්නේ කවර කම්බි කැබැල්ල භාවිතා කළවිටද? (ල.01)

(iii). ඇමීටරයේ වැඩිම පාඨාංකයක් ලැබෙන්නේ කිනම් වර්ගයේ කම්බි කොටස සම්බන්ධ කළ විටද? (ල.01)

(iv). ධාරාවේ ගමනට ඇති බාධාව හඳුන්වන්නේ කවර නමකින්ද? (ල.01)

(v) එදිනෙදා ජීවිතයේදී ධාරාවේ හා විභව අන්තරයේ මිණුම් ලබාගැනීමට අවශ්‍ය වන අවස්ථාවක් ලියන්න. (ල.01)

(ල.16)

02. (A) වෙළඳ පොලේ ආහාරවල මිල ගණන් දිනෙන් දින ඉහළ යමින් පවතී. මෙයට විවිධ හේතූන් බලපාන අතර ආහාර නරක්වීම ද එක් හේතුවකිග

(i). ප්‍රධාන වශයෙන්ම ආහාර නරක්වීමට දායකවන ජීවකාන්ඩය කුමක්ද? (ල.01)

(ii) ඉහත කාන්ඩයට අමතරව ආහාර නරක්වන තවත් ආකාර 02ක් ලියන්න (ල.01)

(iii). ආහාර පරිරක්ෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.01)

(B). ආහාර පරික්ෂණය සදහා භාවිතා වන නවීන උපකරණයක් පහත රූපයේ දැක්වේ.



සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

(i). ඉහත උපකරණයේ නම කුමක්ද? (ල.01)

(ii). ඉහත රූපයේ A , C, සහ D නම් කරන්න (ල.03)

(iii) මෙහිදී ආහාරයේ කුමන වෙනසක් සිදුවේද (ල.01)

(iv). ආහාර කල්තබා ගැනීමට මෙම උපකරණය භාවිතයෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න. (ල.01)

(C) (i) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජන 2ක් ලියන්න. (ල.02)

(ල.11)

03. පහත දක්වා ඇත්තේ විද්‍යාගාරය තුලදී ඔබ විසින් කිසියම් පරිවහන ක්‍රියාවලියක් ආදර්ශනය සඳහා සකස් කරන ලද ඇටවුමකි.



(i). ඉහත ඇටවුමේ A , B , C සහ D නම් කරන්න (ල.02)

(ii). ඉහත ඇටවුම කුමන ක්‍රියාවලියක් ආදර්ශනය කිරීම සඳහා යොදා ගනීද? (ල.01)

(iii). එම ක්‍රියාවලිය පහදන්න. (ල.02)

(iv). එම පරීක්ෂණයේදී සෙලෝපේන් පටලය වෙනුවට භාවිත කලහැකි වෙනත් පටලයක් නම් කරන්න. (ල.01)

(v). මෙම ක්‍රියාවලියේදී සෙලෝපේන් පටලය හරහා ගමන් කල අංශු මොනවාද? (ල.01)

(vi). ශාක වලට පසෙන් ජලය අවශෝෂණය කරගන්නේ කුමන ව්‍යුහය මගින්ද ? (ල.01)

(vii). උත්වේදනය හා බින්දුදය අතර වෙනස් කම් 1ක් ලියන්න. (ල.01)

(viii). සම්පූර්ණ රූපාන්තරණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ල.01)

(ix) මදුරුවාගේ ජීවන චක්‍රය ඇද දක්වන්න (රූප සටහන් ඇද නම් කරන්න) . (ල.01)

(ල.11)

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

04. (A). කශේරුවක් පිහිටී හෝ නොපිහිටීම මත සතුන් පෘෂ්ඨ වංශීන් හා අපෘෂ්ඨ වංශීන් ලෙස වර්ග කෙරේ පෘෂ්ඨවංශී හා අපෘෂ්ඨවංශී සතුන් කිහිපදෙනෙකුගේ රූප පහත දැක්වේ



ඉහත සතුන් අතරින් පහත එක් එක් ලක්ෂණය සහිත සත්ත්වයා හඳුනා ගන්න. එම සත්ත්වයාට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ලියන්න (පහත i සිට vi දක්වා ප්‍රශ්න වලට)

(i). සන්ධි සහිත උපාංග වලින් යුත් ඛණ්ඩනය වූ ශරීරයක් තිබීම.

(ii). සිලින්ඩරාකාර මෘදු දේහයක් තිබිම

(iii). කොරළ සහිත වියලි සමකින් යුත් ශරීරයක් තිබීම.

(iv) ශ්වසනය සඳහා ජලක්ලෝම පිහිටා තිබීම.

(v). අවලතාපී වීම.

(vi) පේශිමය පාදයක් සහිත ඛණ්ඩනය නොවූ මෘදු දේහයක් තිබීම (ල.03)

(B). (i) විද්‍යුත් ලෝහාලේපනය යනු කුමක්ද? (ල.02)

(ii). විදුලිය යොදාගෙන යකඩ හැන්දක් මත තඹ ආලේපනය කරන අවස්ථාවක් පහත රූපයේ දැක්වේ.



(a). A සඳහා යොදා ගත හැකි ද්‍රාවණය නම් කරන්න. (ල.01)

(b) B නම් කරන්න. (ල.01)

(c). තඹ ආලේප වන්නේ හැන්දේ කුමන කොටසේද? (ල.01)

(iii) විද්‍යුත් ධාරාව යොදාගෙන විද්‍යුත් ලෝහාලේපනය කිරීම විද්‍යුත් ධාරාවේ කිනම් ඵලයක් ද? (ල.01)

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

(c) යම් ආහාර ද්‍රව්‍යක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශිත ප්‍රමිති වලට අනුකූලව සකසා ඇති නම් එයට පිරිනමන ලාංඡනයේ නම කුමක් ද? එම ලාංඡනයේ රූපසටහන අඳින්න . (ල.02)

(ල.11)

05. (A) (i) මානව සමෙහි ව්‍යුහය පහත රූපයේ දැක්වේ එහි A සිට F දක්වා කොටස් නම් කරන්න



A .... B - ....
C .... D - ....
E .... F - ....

(ල.03)

(ii). සමෙහි ඇති මෙලනීන් වර්ණකයේ කෘත්‍ය කුමක්ද? (ල.01)

(iii). සමෙහි වෙනත් කෘත්‍යත් 1ක් සඳහන් කරන්න . (ල.01)

(B) (i) දහනය සඳහා අවශ්‍ය ප්‍රධාන සාධක 2ක් ලියන්න (ල.01)

(ii) ගිනි ත්‍රිකෝණය රූප සටහනකින් දක්වා එය නම් කරන්න (ල.02)

(iii) දෙබරුන් දෂ්ට කළවිට අප සිරුරට ඇතුළ් වන විෂ නැසීමට දෙහියුෂ යොදාගන්නේ කුමන හේතුවක් නිසාද ? (ල.01)

(iv) අම්ලයක් සහ භෂ්මයක් එකතු කල විට සෑදෙන ඵලයන් මොනවාද? (ල.01)

(v) විද්‍යුලිය ගමන් කරන ද්‍රවමය ලෝහයක් ලියන්න (ල.01)

(ල.11)

06. (A). අහසෙහි නිරීක්ෂණය කළහැකි අපූර්වතම දර්ශන අතර සූර්යග්‍රහණ සිදුවීම ප්‍රමුඛ අවස්ථාවකි.

(i) සූර්යය ග්‍රහණයක් ඇතිවන අයුරු නම් කල රූපසටහනක් මගින් දක්වන්න. (ල.02)

(ii) සූර්යය ග්‍රහණයක් සිදුවන්නේ කුමන දිනකදීද? (ල.01)

(iii). පොළොවේ සිට කොපමණ පමණ උසකට වායුගෝලය විහිදී පවතීද? (ල.01)

(iv). භූ ස්ථායි චන්ද්‍රිකාවක් යනු කුමක්ද? (ල.01)

(v). අභ්‍යාවකාශ ගාමියෙකු විසින් සිදුකල ප්‍රකාශයක් වන්නේ "මෙය මිනිසෙකුට එක් කුඩා පියවරකි එහෙත් මිනිස් සංහතියට යෝධ පිම්මකි" මෙසේ පවසන ලද්දේ කවුරුන් විසින්ද? (ල.01)

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

(ල.01)

(vi). රාශි චක්‍රය යනු කුමක්ද.

(ල.01)

(vii) සෘතු විපර්යාස ඇතිවන අයුරු කෙටියෙන් ලියන්න්

(ල.01)

(B) (i) ස්වභාවික ආපදා යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

(ල.01)

(ii) ශ්‍රී ලංකාවට බල පෑ හැකි ස්වභාවික ආපදා 1 ක් ලියන්න.

(iii) නායයෑම් අවදානම ඇති දිස්ත්‍රික්කයක යම් ඉදිකිරීමක් සිදුකරන්නේ නම් මුලින්ම ඒ පිළිබඳව උපදෙස් ලබාගත

(ල.01)

යුතු ආයතනය කුමන නමකින් හදුන්වයිද?

(ල.11)

07. (A). ශාක විසින් සිදුකරන ආහාර නිපදවීමේ ක්‍රියාවලිය ප්‍රභාසංශ්ලේෂණය යි.

(ල.01)

(i). ශාකයක ආහාර නිපදවන ප්‍රධානතම ව්‍යුහය කුමක්ද?

(ල.01)

(ii). ප්‍රභාසංශ්ලේෂණය සඳහා අවශ්‍ය සාධක මොනවාද?

(ල.01)

(iii) ශාකය තුළට CO_2 ඇතුල්වන්නේ කුමන ව්‍යුහය තුලින්ද ?

(iv). ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය පහත පරිදි වචන සමීකරණයකින් දැක්විය හැක. එහි A හා B හිස්තැන් පුරවන්න

කබන්ඩයොක්සයිඩ + A —සූර්යය අලෝක ශක්තිය / හරිත ප්‍රද— ________ B + ඔක්සිජන් (ල.02)

(v). ශාක පත්‍රයක පිෂ්ටය අඩංගුදැයි පරීක්ෂා කිරීමට සිදුකරන පරීක්ෂණ ඇටවුමක් පහත රූපයේ දැක්වේ



a - ජලයේ තැම්බීම b - ජල තාපකයක ආධාරයෙන් පත්‍රය මද්‍යසාරයේ තැම්බීම

(a). මෙහිදී ශාකපත්‍රය මධ්‍යසාරයේ තම්බා ගන්නේ ඇයි?

(ල.01)

(b). ශාක පත්‍රය මධ්‍යසාරයේ තම්බන විට ජලතාපකයක තබා එය සිදු කරන්නේ ඇයි?

(ල.01)

සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

(c). ප්‍රභාසංශ්ලේෂණ සිදුවී තිබුනි නම් අවසාන පියවර ලෙස මධ්‍යසාරයේ තම්බන ලද පත්‍රය ජලයෙන් සෝදා අයඩින් දැමූ විට ශාක පත්‍රයේ වර්ණය කුමක්ද? (ල.01)

(B). (i). වඩා ප්‍රබල චුම්බක සෑදීමට භාවිතා කරන්නේ කවර චුම්බක ද්‍රව්‍යද? (ල.01)

(ii). චුම්බකයක චුම්බක බලය වැඩිපුරම ක්‍රියාකරන තැන් මොනවාද? (ල.01)

(iii). චුම්බකයක චුම්බක බලය ක්ෂය වන ක්‍රම 1ක් ලියන්න. (ල.01)

(ල.11)